විශාඛා විද්‍යාලය, කොළඹ 5

පළමු වාර පරීක්ෂණය- 2016

ඉතිහාසය

7 ශ්‍රේණිය

කාලය : පැය 2 යි

නම / අංකය : ........................................................................................................

## I කොටස

❖ ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.

❖ නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

1) තිසෙල්පිටිය ගමේ වාසය කළ සහෝදරයන් පස් දෙනෙකු එක් වී ළිඳ වැපිරීමට හේනක් සකස් කළ බව දැක්වෙන්නේ කුමන රජුගේ කාලයේදී ද?
(i) කාවන්තිස්ස රජ (ii) I විජය බාහු රජ (iii) I සේන රජ (iv) මානවම්ම රජ

2) සාලිය කුමාරයා උපන් කාලයේ ඇල් වී අස්වැන්න ඉහළ ගිය බව සඳහන් වන්නේ,
(i) මහා වංශයේ (ii) සීහළ වත්ථු ග්‍රන්ථයේ
(iii) සහස්ස වත්ථුපකරණයේ (iv) මූලාශ්‍රවල

3) මින්නේරිය වැව කරවා කෘෂි කර්මයට මහත් අනුග්‍රහයක් දැක්වූයේ,
(i) දේවානම් පියතිස්ස රජු (ii) II සේන රජු
(iii) මහාසේන රජු (iv) I විජයබාහු රජු

4) අකලහස, මදහස, පිටදඩහස යනුවෙන් වී වගාව සඳහා කන්න තුනක් පැවති බව සඳහන් වන්නේ,
(i) පැරණි මූලාශ්‍රවල (ii) පඤ්චිකා පොතේ
(iii) මහා වංශයේ (iv) තෝනිගල සෙල්ලිපියේ

5) අතීතයේදී කර්මාන්ත බිහි වී තිබුණේ,
(i) වෙළඳපොළ ආශ්‍රිතවය
(ii) අමුද්‍රව්‍ය පහසුවෙන් ලබාගත හැකි ප්‍රදේශ ආශ්‍රිතවය
(iii) ශ්‍රමය පහසුවෙන් ලබාගත හැකි ප්‍රදේශ ආශ්‍රිතවය
(iv) තවලම් ආශ්‍රිත ප්‍රදේශවලය

(ලකුණු 2× 5 =10)

(2) හිස්තැන් පුරවන්න.

6) වෙළෙන්දන් සංවිධානය වී සිටි වෙළඳ ශ්‍රේණි .................................... හා .................................... නමින් හැඳින්විය.

7) වෙළඳාමේ ඇති වූ අකට යුතුකම් පිළිබඳව සොයා බලා IV උදය රජු එය වැළැක්වීම සඳහා .................................... කරවන ලදි.

8) අතීත ශ්‍රී ලංකාවේ විදේශ වෙළඳාම සඳහා .................................... හා .................................... වරායන් යොදා ගනු ලැබිය.

9) අන්තම් ක්‍රමය යනු ........................................... භුවමාරු කර ගැන්මේ ක්‍රමයයි.

10) මානවම්ම රාජ්‍යය සමයේදී නීතිරීති පිළිබඳව ....................................... ශිලා ලිපියෙන්ද මුල්‍ය කළමනාකරණය පිළිබඳව ........................................... පුවරු ලිපියෙන්ද සඳහන්ය.

(ලකුණු 2×8=16)

(3) පහත දැක්වෙන වගන්ති නිවැරදි නම් (✓) ලකුණ ද, වැරදි නම් (✗) ලකුණ ද යොදන්න.

11) අනුරාධපුර යුගයේදී රජවරු සමාජ සුබ සාධනය සඳහා විශේෂ උනන්දුවක් දැක්විය. ☐

12) චෝල රාජ්‍යයේ අගනුවර තන්ජෝරයයි. ☐

13) අනුරාධපුර රාජධානියේ ආරම්භක රජු විජය රජුය. ☐

14) මාගම සිට අනුරාධපුරයට පැමිණි සුරනිමල යෝධයා එහිදී වෙළඳසැලකින් සුවඳ විලවුන් මිලදී ගත් බව මූලාශ්‍රවල සඳහන් වේ. ☐

15) සූප ශාස්ත්‍රයෙන් දක්ෂ කාන්තාවන් මධුපාචිකා යනුවෙන් හඳුන්වා ඇත. ☐

(ලකුණු 2×5 =10)

(4) සිතියමට අනුව අංකිත ප්‍රදේශ නම් කරන්න.




1) ....................................

2) ....................................

3) ....................................

4) ....................................

(ලකුණු 1×4 =04)

(මුළු ලකුණු 20×2 =40)

## II කොටස

❖ පළමුවන ප්‍රශ්නය අනිවාර්ය වේ. මෙම ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 5 කට පමණක් පිළිතුරු ලියන්න.

(01) ඔබ විසින් සකසන ලද ක්‍රියාකාරකමට අනුව පහත දැක්වෙන ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

(i) ඔබ කණ්ඩායම විසින් පිළිතුරු ලබාදෙන ලද මාතෘකාව කුමක්ද? (ලකුණු 1)

(ii) එය උපුටාගනු ලැබුවේ කුමන පාඩම යටතේද? (ලකුණු 1)

(iii) මෙහිදී ඔබ යොදාගනු ලැබූ තේමාවන් 4 ක් ලියන්න. (ලකුණු 4)

(iv) මේ සඳහා ඔබ යොදාගත් මූලාශ්‍ර 2 ක් ලියන්න. (ලකුණු 2)

(v) මෙම ක්‍රියාකාරකම තුළින් ඔබ ජීවිතයට ලබාගත් අත්දැකීම් 2 ක් ලියන්න. (ලකුණු 2)

(vi) මෙම ක්‍රියාකාරකම තුළින් ඔබ සොයාගත් ලැබූ අතීත සමාජයේ ආර්ථිකය තුළ දක්නට ලැබුණු විශේෂ ලක්ෂණ 03 ක් ලියන්න. (ලකුණු 3)

(vii) එයින් ඔබ ජීවිතයට ලබාගත හැකි ආදර්ශ 03 ක් නම් කර දක්වන්න. (ලකුණු 3)

(මුළු ලකුණු 16)

❖ 02 – 07 දක්වා ඇති ප්‍රශ්නවලින් <u>ප්‍රශ්න 4 කට</u> පමණක් පිළිතුරු ලියන්න.

(02) (i) අපේ පැරණි ජන සමාජයේ ආර්ථිකයේ කෘෂිකර්මාන්තය බෙදුණු ප්‍රධාන කොටස් 2 නම් කරන්න. (ලකුණු 2)

(ii) අතීත ජනතාව ජීවනෝපාය සඳහා යෙදුණු විවිධ වෘත්තීන්වලට උදාහරණ 4 ක් නම් කරන්න. (ලකුණු 4)

(iii) අතීත ජනතාව කෘෂිකර්මාන්තයේ යෙදීමේදී මුහුණ දුන් අභියෝග 02 ක් නම් කර එය ජයගත් අයුරු දක්වා එය ඔබ ජීවිතයේ අරමුණු ජය ගැනීම සඳහා යොදාගන්නා අයුරු කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 5)

(ලකුණු 11)

(03) (i) කැලෑ ගිණිතබා එළිපෙහෙළි කර සකස් කර ගන්නා බිම් හඳුන්වන නම් 02 ක් ලියන්න. (ලකුණු 2)

(ii) මේවා හඳුන්වන්න

1) තවදැලි හේන
2) ගිහි යාතිකාව
3) හැලි කටා
4) සාලි

(ලකුණු 4)

(iii) අතීත ශ්‍රී ලංකාවේ පැවති හේන් වගාව පිළිබඳව ප්‍රධාන කරුණු 5 ක් ලියා දක්වන්න. (ලකුණු 5)

(ලකුණු 11)

(04) (i) අතීත ශිලා ලිපිවල ගම් තැන වූ හා වැව් අයිතිව සිටි අය හැඳින් වූ නම් 02 ක් ලියන්න. (ලකුණු 2)

(ii) මේවා හඳුන්වන්න

1) ගෝපාලගම් –
2) කසිකාරගම් –
3) නිගම –
4) පුග -

(ලකුණු 4)

(iii) මෙකල පැවති වෙළඳාමේ ප්‍රධාන කොටස් 2 දක්වා එයින් එක් වෙළඳ ක්‍රමයක් පැවති ආකාරය විස්තර කරන්න. (කරුණු 5 කට ලකුණු 3) (ලකුණු 5)

(ලකුණු 11)

(05) (i) මානවම්ම රාජ්‍යය සමයට පෙර මෙරට පාලනය කළ රාජවංශ 02 ක් නම් කරන්න. (ලකුණු 2)

(ii) මානවම්ම පාලනයේදී පාලන කටයුතු සඳහා රජුට සහාය වූ නිලධාරීන් 4 ක් නම් කරන්න. (ලකුණු 4)

(iii) මෙම රජවරුන් හැඳගත් වීමට බලපෑ කරුණු 1 බැගින් ලියන්න.

1) මාන කුමරු
2) I සේන
3) නරසිංහ වර්මන්
4) ශ්‍රී මාර ශ්‍රී වල්ලභ
5) II වරගුණ වර්මන්

(ලකුණු 5)
(ලකුණු 11)

(06) (i) මහා විජය බාහු රජු පිළිබඳව ඉගෙනීමට ඇති මූලාශ්‍ර 02 ක් නම කරන්න. (ලකුණු 2)

(ii) වරින් වර මෙරටට ආක්‍රමණ එල්ල කල ද.ඉන්දියානු රාජ්‍යය 04 නම් කරන්න.
(ලකුණු 4)

(iii) මහා විජයබාහු රජු සොලීන් පරාජය කිරීම සඳහා අනුගමනය කල ක්‍රියාමාර්ග 02 ක් දක්වා එයින් අපගේ ජීවිතය සාර්ථක කරගැනීම සඳහා ගත හැකි ආදර්ශ 03 ක් ලියන්න.
(ලකුණු 5)
(ලකුණු 11)

(07) (i)



1) මෙය කුමක්ද? (ලකුණු 1)

2) මෙය යොදාගනු ලැබුවේ කුමන කටයුත්තක් සඳහා ද? (ලකුණු 1)

3) මෙම උපකරණය යොදාගනු ලැබූ කර්මාන්තය වගා කරනු ලැබූ කාල 02 නම් කරන්න. (ලකුණු 2)

(ලකුණු 4)

(ii)



1) මෙම පරිවහන ක්‍රමය අතීතයේදී හඳුන්වනු ලැබුවේ කුමන නමකින්ද? (ලකුණු 1)

2) මේ සඳහා යොදාගනු ලැබූ ගවයන් හැඳින් වූ නම් 02 ක් ලියන්න. (ලකුණු 2)

3) මේවා යොදාගනු ලැබුවේ කුමක් සඳහා ද? (ලකුණු 1)

(ලකුණු 4)

(iii)



1) මෙම රූපයෙන් දැක්වෙන්නේ කුමක්ද? (ලකුණු 1)

2) මෙය අයත්වන්නේ කුමන රාජධානි යුගයකට ද? (ලකුණු 1)

3) මෙය ප්‍රතිසංස්කරණය කරනු ලැබූ රජතුමා කවිද? (ලකුණු 1)

(ලකුණු 3)

(ලකුණු 11)
(මුළු ලකුණු 60)